# කෘෂි ළිං කේන්ද්‍ර කොටගත් සංවර්ධනයේ දී මතු විය හැකි ගැටළු කිහිපයක්.

**එම්. ජී. එම්. රසාක්**
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

කෘෂිකාර්මික ළිං හෝ වගා ළිං මුල් කොටගෙන ග්‍රාමීය කෘෂිකර්මාන්තය නඟාලීම සඳහා රජය හා රාජ්‍ය නොවන ආයතන රාශියක් වියලි කලාපයේ ජලය හිඟ ප්‍රදේශවල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරයි. මහා වාරිමාර්ග සංවර්ධනය තුළින් අපේක්ෂිත ප්‍රමාණයට ග්‍රාමීය කෘෂිකර්මාන්තයේ ජල ප්‍රශ්ණයට හෝ ආර්ථික දරිද්‍රතාවයට හා සමාජ අසමානතාවයට විසඳුම් සෙවීමට අපහසු තත්ත්වයක් තුළ කුඩා ප්‍රජාවන් වශයෙන් වියලි කලාපයේ ව්‍යාප්ත වී සිටින දිළිඳු ගොවි පවුල් නඟා සිටුවීමට නව මඟක් වශයෙන් වගා ළිං ඇති කිරීම ආරම්භ විය. මෑතක දී වගා ළිං ආශ්‍රිත ආර්ථික සංවර්ධනය පිළිබඳ කළ පර්යේෂනවලින් පෙන්වා දෙන පරිදි, වගා ළිං මගින් කෘෂිකර්මාන්තයේ යෙදුන ගොවීන්ගේ ආර්ථිකය සාපේක්ෂ වශයෙන් සීඝ්‍ර ලෙස දියුණු වී ඇති බව පෙන්වා දී ඇත. එසේම පසුගිය වසර පහක කාලයක් තුළ දත්තයන් විමර්ශනය කිරීමේ දී වගා ළිං තැනීම් ද වැඩි වී ඇත. කෘෂිකර්මාන්තයේ ජල ප්‍රශ්නයට විසඳුමක් ලෙස අඩු ආයෝජනයක් ඇතිව වගා ළිං තැනීම සුළු ගොවියන් අතර ජනප්‍රිය වීම තුළින් ඇතිවිය හැකි ප්‍රතිවිපාකයන් දෙස සංවර්ධනවේදීන් හෝ ප්‍රතිපත්ති සම්පාදකයන් හෝ ගොවි ජනතාව එතරම් සැළකිල්ලක් දක්වා නැත. මෙම ලිපියෙන් පෙන්වා දීමට උත්සාහ කරනුයේ සැලසුම් රහිත ලෙස වගා ළිං තැනීමෙන් ඇති විය හැකි ප්‍රතිඵල කීපයක් පෙන්වා දීමටයි.

**භූගත ජල මට්ටම අඩුවීම තුළින් ඇතිවන ප්‍රතිවිපාක**

ලංකාවේ වගා ළිං සංවර්ධනය මෑතකාලීන සංසිද්ධියක් වුවත් ඉන්දියාව බංග්ලාදේශය, නේපාලය, චීනය වැනි රටවල මෙය කාලයක් මුළුල්ලේ කෘෂිකර්මාන්තය සඳහා වාරි ජල සම්පාදන ක්‍රමයක් ලෙස ගොවීන් අතර ප්‍රචලිත වී ඇත. විශේෂයෙන් ඉන්දියාවේ හා බංග්ලාදේශයේ වගා ළිං තැනීම් බහුල ලෙස කිරීම හේතුවෙන් වියළි ප්‍රදේශවල භූගත ජල මට්ටම සීඝ්‍රයෙන් පහත වැටී ඇති බව විද්‍යාඥයන් විසින් පෙන්වා දී ඇත. ලංකාවේ ද වියළි කලාපීය ප්‍රදේශවල විශේෂයෙන් අනුරාධපුර, පොළොන්නරුව හා කුරුණෑගල දිස්ත්‍රික්කවල වගා ළිං තැනීමේ වේගය දෙස බලන විට නුදුරු අනාගතයේ දීම මේ ප්‍රදේශවල භූගත ජල මට්ටම සෑහෙන ප්‍රමාණයකින් පහත වැටීමට ඉඩ ඇත. මේ පිළිබඳව වුවද අප රටේ විද්වතුන් තවමත් ප්‍රමාණවත් අවධානය යොමුකර නොමැත. සමාජීය වශයෙන් ගත්විට මෙසේ වගා ළිං සීඝ්‍රයෙන් ව්‍යාප්තවීමත්, එමගින් නිශ්චිත භූමි ප්‍රදේශයක භූගත ජල මට්ටම අඩුවීම හේතුවෙන් දිළිඳු ගැමියන් අතර නැවත වතාවක්, එකිනෙකා පරයා ඉදිරියට යාමේ තරගයකුත්, එමගින් සම්පත් හිමි, ගොවියා ජයග්‍රාහී ලෙසත්, සම්පත් අහිමි දිළිඳු ගොවියා තව තවත් පහත වැටීමටත් ඉඩ ඇත. තවදුරටත් විග්‍රහ කරන්නේ නම් වගා ළිං මුල් කොට ගෙන ගොවියාගේ ආර්ථිකය දියුණුවීමත් සමඟම වගා ළිං තැනීමට දිළිඳු ගොවියන් වැඩියෙන් පෙළඹෙනු ඇත. සාපේක්ෂ වශයෙන් අඩු ආයෝජනයක් නිසා දිළිඳු ගොවියා වගා ළිං තැනීමට පෙළඹුනත් කාලයක් යාමේ දී මෙය තරගයක් බවට පරිවර්තනය වේ. තරගය උත්සන්න වීමට සාපේක්ෂව භූගත ජල මට්ටම පහත වැටීම ද සිදුවනු ඇත. භූගත ජල මට්ටම පහත වැටෙන විට නැවත ළිං වල ගැඹුර වැඩි කිරීමට ගොවීන් පෙළඹෙනු ඇත. කාලයත් යාමේ දී මෙසේ වගා ළිං තැනීම ආර්ථික වශයෙන් දැඩි වියදමක් මෙන්ම, ජලය ලබාගත හැකි දෝයි යන අවදානමට ද සුළු ගොවියා මුහුණ දෙනු ඇත. මේ නිසා අලුතින් වගා කටයුතු අරඹන දිළිඳු ගොවීන් ළිං තැනීම නවතා පැරණි ළිං අයිතිකරුවන් ගෙන් බද්දට, කුලියට හෝ මුදලට ජලය ලබා ගැනීමෙන් ගොවිතැන් වල යෙදෙනු ඇත. දිළිඳු ගොවියා නැවතත්, පරාධීන ආර්ථික තත්ත්වයකට පත් වෙනු ඇත. මෙය බැලූ බැල්මට උප කල්පිත තත්ත්වයක් ලෙස දිස් වුණත් දකුණු ඉන්දියාවේ හා බංග්ලාදේශයේ කරන ලද සමීක්ෂණ වලින් මෙවැනි ප්‍රවණතා දක්නට තිබෙන බව සොයා ගෙන ඇත. මේ නිසා ගොවි ප්‍රජාවේ පහළම ස්ථරයට පවා සහන සලසන ක්‍රමයක් ලෙස සලකමින් සැලසුම් රහිත ලෙස වගා ළිං කැනීම් වලට ඉඩ දීමෙන් දිළිඳු ගොවියන් තව තවත් පහලට ඇද දැමීම වළක්වා ලීමට අප පියවර ගත යුතුය.

**පැරණි කුඩා වැව් ජරාවාස වීම හා ඒ ආශ්‍රිත ගැටළු :**

දැනට වගා ළිං කැනීම ආශ්‍රයෙන් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවියන් බොහෝ විට කලින් කුඩා වැව් ආශ්‍රිතව ගොවිතැන් කළ පුද්ගලයන් වෙති. රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනවල සංවර්ධන අවධානයට ලත් නොවූ මෙවැනි කුඩා වැව් නඩත්තු කළේ ගම්මුන් විසිනි. ඒ සඳහා ඔවුන් අතර අන්‍යෝන්‍ය අවබෝධයක් ගොඩ නගා ගත් සංවිධාන රටාවන් ද පැවතිනි. වගා ළිං කැනීම් ගොවීන් අතර ජනප්‍රිය වීමෙන් පෙර කී කුඩා වැව් අත්හැර දැමීමට ගොවීන් පෙළඹෙනු ඇත. ඒවා නඩත්තු කිරීමට තිබුණ සංවිධාන රටාවන් ද ඒ සමඟම අභෝසි වී යනු ඇත. මෙවැනි තත්ත්වයන් තුළ එක් අතකින් වගා ළිං වැඩි වීමත් සමඟම වැවේ භූගත ජල මට්ටම අඩු වනවා පමණක් නොව නඩත්තු අත්හැරීමෙන් පෝෂක ප්‍රදේශයෙන් ලැබෙන ජලය නැතිවී යාමෙන් කුඩා වැව් අභාවයට යනු ඇත. පාරිසරික වශයෙන් එය තර්ජනයක් වෙනවා පමණක් නොව තම ගවයන් සඳහා තණබිම් සොයා ගැනීම ද ගොවීන්ට ප්‍රශ්ණයක් වනු ඇත. මේ නිසා බැලූ බැල්මට රජයට හෝ ගොවියන්ට කුඩා වැව් පිළිසකර කර ජල මාර්ග සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම වගා ළිං දියුණු කිරීමට වඩා ආර්ථික වශයෙන් අවාසි වුවත් ආර්ථික වශයෙන් මිනිය නොහැකි පාරිසරික හා සමාජමය ප්‍රතිවිපාක වලට මුහුණ දීමට මුළු රටටම සිදුවනු ඇත.

**පුද්ගලවාදය ඉස්මතු විම හා ගැමි සාමූහිකත්වය නැතිවීම :**

සාම්ප්‍රදායික කුඩා වැව් ආශ්‍රිත ග්‍රාමීය සමාජයේ වැව, කැළය, වැවේ ජලය, ජල මාර්ග ආදිය ගැමියන් සැළකුවේ ප්‍රජාවේ සම්පත් ලෙසය. එම නිසා ඒවා ආරක්ෂා කිරිම හා නඩත්තු කිරීම් කළේ ප්‍රජා යුතුකම් හැටියට සළකමිනි. මෑතක් දක්වා රීතියා සංවර්ධන මායාවට හසු නොවූ මෙවැනි ගැමි ප්‍රජාවන් අද සීඝ්‍රයෙන් නාගරීකරණය වෙමින් හා සම්පත් ඒකරාශී කර ගැනීමේ තරඟයට එක් වෙමින් එකිනෙකා පරයා

16 පිටුවට ➪

## කෘෂි ළිං කේන්ද්‍රකොටගත්....

13 පිටුවෙන්

ඉදිරියට යාමට උත්සාහ කරති. ඒ අතින් බලන විට කෘෂි ළිං හඳුන්වා දීමෙන් ද අප කරනුයේ කලක් කුඩා වැවක් ආශ්‍රිතව ප්‍රජාවක් ලෙස එක්වී සිටි පිරිසක් පවුලක් මුල් කොට ගත් පුද්ගලවාදී සංවර්ධනයට යොමු කිරීමය. වෙනත් වචන වලින් කිවහොත් ගමේ වැවෙන් ජලය ලබා ගෙන කුඹුර අස්වද්දාගත් ගොවීන්, හෝ ආධාර ලබා ගෙන තම ගොවිපොලේම ළිඳක් හාරා ගොවිතැන් කිරීමට පෙළඹවීමෙන් ඔහු හා එම ප්‍රජාවේ අනෙක් සාමාජිකයන් අතර, අන්‍යොන්‍ය සුහදතාවය හා සබඳකම බිඳ වැටෙනු ඇත. ප්‍රජා උවමනාවට වඩා පුද්ගල උවමනාවන්, ප්‍රජා දේපල වෙනුවට පුද්ගල දේපල ක්‍රමයක් හා ඒ ආශ්‍රයෙන් ප්‍රජාවේ එකිනෙකා අතර තරඟයක් ද ඇති වනු ඇත. වගා ළිං, ගොවියන් කිහිප දෙනෙකුට එක බැගින් ලබා දීමෙන් එය සාමූහික දේපලක් හැටියට පරිහරණය කිරීමට ඔවුන් පෙළඹවිය හැකි වුවත් ඒ සඳහා දැනට අප එතරම් සැලකිල්ලක් දක්වා නැත. අනික, සාමූහික හෝ කණ්ඩායම් ක්‍රමයකට වගා ළිං සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ග්‍රාමීය මට්ටමේ ආයතනික ව්‍යුහයන් රාජ්‍ය අංශයේ කෘෂිකාර්මික සංවර්ධන සංවිධාන සතුව නැත.

**සම්පිණ්ඩනය :**

මෙම කෙටි ලිපියෙන් මා පෙන්වාදීමට උත්සාහ කළේ කෘෂි ළිං කේන්ද්‍ර කොට ගෙන ගොවිතැන් වල යෙදීමෙන් ආර්ථික වශයෙන් කෙටිකාලීන ප්‍රතිලාභ අත්වුවත්, ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක් ලෙස කෘෂි ළිං ව්‍යාප්ත කිරීමට යාමේදී ප්‍රතිපත්ති සම්පාදකයන්, සංවර්ධනවේදීන් පමණක් නොව ගොවීන් පවා අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් ගැනය. විශේෂයෙන් භූගත ජල මට්ටම අඩුවීමත්, කුඩා වැව් අතහැර දැමීමත් හේතුවෙන් මතු විය හැකි පාරිසරික හා සමාජමය ප්‍රතිවිපාක දෙස අප දැන් සිටම අවධානය යොමු කළ යුතුය. සාම්ප්‍රදායික ග්‍රාමීය සමාජ ව්‍යුහය වෙනස් වීම් වගා ළිං නිසා පමණක් නොව විවිධ සංවර්ධන හා පරිපාලන බලවේග තුළින් ද සංකීර්ණ වශයෙන් සිදු වෙන ක්‍රියාදාමයකි. එහෙත් සංවර්ධනවේදීන් වශයෙන් අප රටේ සීමිත සම්පත් සාධාරණ ලෙස සමාජයේ බෙදී යන හැටියටත්, සංවර්ධන මැදිහත්වීම් පරිසරයට හානි නොවන හැටියටත්, වග බලාගත යුතුය. හුදෙක් කෙටි කාලීන ආර්ථික ප්‍රතිලාභ තුළින් පමණක් මෙහිදී, සංවර්ධනයේ සාර්ථකත්වය ලබා ගත නොහැකි බවත් මැනිය නොහැකි බවත් යන්න අවධානයට ලක් විය යුතු කරුණු වලින් කිහිපයක් වේ.